# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2308/55 - 2022 දෙසැම්බර් මස 03 වැනි සෙනසුරාදා - 2022.12.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය: KES/DS/LND/AC/8/5/26.*
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: 4-3/9/2021/බීජ්/183.*

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 535ඒ, බෙල්ලන්විල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බෙල්ලන්තර (බොරලැස්ගමුව නගර සභා සීමාව තුල) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් වෙනුවෙන් කොළඹ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද මූලික පිඹුරු අංක කො.9996 හා 2022.10.13 දිනැති පිඹුරේ කැබලි අංක 1 හා 3 වශයෙන් පෙන්නුම් කර ඇති මුළු බිම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0363 ක් වූ පහත සඳහන් ඉඩම් කොටස් (02)

**01. කැබලි අංක 1**
ඉඩමේ නම: කදුරුගහකුඹුර; ඉඩමේ විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: අංක 78, අලකේෂ්වර පාර, ඇතුල්කෝට්ටේ, කෝට්ටේ ලිපිනයේ පදිංචි ජී. ආර්. ඩයස් අබේගුණවර්ධන සහ නාලනී ඩයස් අබේගුණවර්ධන (අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා); ප්‍රමාණය: හෙක්: 0.0068.

**02. කැබලි අංක 3**
ඉඩමේ නම: කදුරුගහකුඹුර, මූණමල්ගහ කුඹුර; ඉඩමේ විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: අංක 78, අලකේෂ්වර පාර, ඇතුල්කෝට්ටේ, කෝට්ටේ ලිපිනයේ පදිංචි ජී. ආර්. ඩයස් අබේගුණවර්ධන සහ නාලනී ඩයස් අබේගුණවර්ධන (අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා); ප්‍රමාණය: හෙක්: 0.0295.

ඉහත සඳහන් ඉඩම් වල හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන්ගේ හෝ

ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2023 ජනවාරි මස 19 වැනි දින පෙ.ව. 9.30 ට කැස්බෑව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2023 ජනවාරි මස 12 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

**කේ. පී පේමදාස,**
ප්‍රාදේශීය ලේකම් / ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි,
කැස්බෑව.

2022 නොවැම්බර් මස 28 දින,
කැස්බෑව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

EOG 12-0057